**ශීර්ෂය 266 - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වවුනියාව**

---------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වවුනියාව දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුලි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින්,වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සැසඳීමක් කළ නොහැකළු් හේතුවෙන්ම ඉකුත් ,තවද . කාශන පිළිබ ප්‍රවර්ෂයේ මූල්‍යාඳ නිර්දේශද මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර නැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උක්ත චක්‍රලේඛයේ 7(ii) ඡේදය අනුව ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් රැස්කරනු ලබන ආදායම් භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල් ලෙස සලකා ඒසීඒ - 3 ආකෘතියේ (අග්‍රිම ගිණුමේ) ඇතුළත් කර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වෙනත් ලැබීම් ලෙස දැක්විය යුතු විය. එහෙත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් රැස්කරන ලද රු.56,713,387 ක ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් නොකර අග්‍රිම ගැලපුම් ගිණුමට ඇතුළත් කර තිබුණි. මේ හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය කාර්යය සාධනය රු.56,713,387 කින් අඩුවෙන් දක්වා තිබුණි. | රැස්කරනු ලබන ආදායම් භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල් ලෙස සලකා ඒසීඒ - 3 ආකෘතියේ (අග්‍රිම ගිණුමේ) ඇතුළත් කළ යුතු වීම. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(ii) ඡේදය ප්‍රකාරව ඒසීඒ - 3 ට ඇතුළත් කර ඇති අතර අමාත්‍යාංශයේ උපදෙස් මත ඒ.සී.ඒ.එෆ් පිළියෙල කර ඇත. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම් වටිනාකම් රු.52,999,580 ක් වූ අතර, ජංගම නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ඒසීඒ - 6) අනුව වර්ෂය තුළ ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම්වල වටිනාකම රු.39,951,796 ක් වූයෙන් එම වටිනාකම් අතර රු.13,047,784 ක වෙනසක් නිරීක්ෂණය විය. | වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුමේ සටහන් කළ යුතු වීම. | මුළු වත්කම් මිලදී ගැනීම් වටිනාකම රු.52,999,580 ක් වේ. CIGAS වැඩසටහන හා පොත්වල ශේෂ අසමාන වූ නිසා නැවත අලුතින් CIGAS වැඩසටහනට වත්කම් ඇතුළත් කිරීමේදී ජනවාරි සිට අගෝස්තු දක්වා වූ මිලදී ගැනීම් වටිනාකම් ආරම්භක ශේෂයට ඇතුළත් කර ඇත. ඒසීඒ - 6 හි සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා මිලදී ගැනීම් පමණක් ඇතුළත් කර ඇත. දැනට CIGAS හා දෙපාර්තමේන්තු පොත් අතර |

| | | | |
|---|---|---|---|
| | | | වත්කම් සැසඳේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වල භෞතික වත්කම් ඉදිකිරීම් හා මිලදී ගැනීම් ලෙස රු.1,167,905,185 ක් දක්වා තිබුණු අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම් වටිනාකම රු.39,951,796 ක් ලෙස දක්වා තිබුණි. මේ අනුව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා ඒසීඒ - 6 ආකෘතිය අතර ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම් වලට අදාළව රු.1,127,953,389 ක වෙනසක් නිරීක්ෂණය විය. | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වල භෞතික වත්කම් ඉදිකිරීම් හා මිලදී ගැනීම් වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම් වටිනාකම හා ගැළපිය යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ අනෙකුත් අමාත්‍යාංශවල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් ඉදිකිරීම් වටිනාකම්ද ඇතුළත්ව ඇති අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ රු.71,610,158 ක් පමණක් ඇතුළත්ව ඇත. |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ තැන්පතු ගෙවීම්වල වටිනාකම රු.217,842,503 ලෙස දක්වා තිබුණද, මාසික සාරාංශ අනුව තැන්පතු ගෙවීම්වල එකතුව රු.259,672,832 ක් විය. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා මාසික සාරාංශ අතර තැන්පතු ගෙවීම්වලට අදාළව රු.41,830,329 ක වෙනසක් නිරීක්ෂණය විය. | වටිනාකම් නිවැරදිව හඳුනාගෙන සටහන් කළ යුතුවීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදලින් කරන ලද ගෙවීම් පමණක් දක්වා ඇත. තැන්පතු ගෙවීම් වල වැඩිපුර ඇත්තේ X Entry මඟින් වියදම් කර ඇති ප්‍රමාණයයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රජයේ නිලධාරීන්ට ණය අත්තිකාරම් ලබා දීම මගින් සමාලෝචිත වර්ෂය තුළ ලබාගෙන තිබුණු රු.2,495,280 ක පොළී මුදල් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර ඉදිරිපත් කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | අත්තාකාරම් ගිණුමෙන් ලද පොළී මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කළ යුතුවීම. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(ii) ඡේදය ප්‍රකාරව ඒසීඒ - 1 ට ඇතුළත් කළ යුතු නැත. ඒසීඒ - 3 හි ඇතුළත් කරන ලදී. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ භෞතික වත්කම් විකිණීමෙන් ලැබී තිබුණු රු.165,490 ක මුදල් ප්‍රමාණය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් විකිණීමෙන් ලද මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කළ යුතු වීම. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(ii) ඡේදය ප්‍රකාරව ඒසීඒ - 1 ට ඇතුළත් කළ යුතු නැත. ඒසීඒ - 3 හි ඇතුළත් කරන ලදී. |
| (ඈ) | ඒ.සී.ඒ - 6 ආකෘතිය අනුව ජංගම නොවන වත්කම් විකිණීමෙන් ලද රු.495,451,591 ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වල භෞතික වත්කම් විකිණීමෙන් ලද මුදල් ලෙස ඇතුළත් කර නොතිබුණි. | ඒසීඒ - 6 ආකෘතිය අනුව ජංගම නොවන වත්කම් විකිණීමෙන් ලද මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වීම. | රු.495,451,591 ක මුදල වැරදීමකින් විකුණුම් ලෙස දක්වා ඇති අතර සත්‍ය විකුණුම් ලෙස රු.182,260 ක් පමණක් ඇතුළත් විය යුතු අතර ඉතිරිය වත්කම් මාරුකිරීම් ලෙස දැක්විය යුතුය. |

**1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2012 ජනවාරි 5 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම්වරයා සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයින් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් එම චක්‍රලේඛයේ 3.2 ඡේදයේ සඳහන් ලිපි ලේඛණ පරික්ෂා කර යෝග්‍යතාවය සමාලෝචනය කිරීමෙන් අනතුරුව සුදුසු ප්‍රජා පාදක සංවිධානෙවලට වැඩ කොන්ත්‍රාත් පැවරීම කල යුතු වේ. එසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රජා පාදක සංවිධාන වෙත රු.21,271,876 ක් වටිනාකමැති කොන්ත්‍රාත් 33 ක් පැවරීමේදී ඒ සම්බන්ධයෙන් අදාළ ප්‍රජා පාදක සංවිධාන වල යෝග්‍යතාවය පරික්ෂා කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2012 ජනවාරි 5 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම්වරයා සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයින් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් එම චක්‍රලේඛයේ 3.2 ඡේදයේ සඳහන් ලිපි ලේඛණ පරික්ෂා කර යෝග්‍යතාවය සමාලෝචනය කළ යුතු වීම. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සියලුම වැඩ ප්‍රාදේශීය ලේකම්, තාක්ෂණ නිලධාරි, ග්‍රාම සංවර්ධන නිලධාරින්ගෙන් සමන්විත කමිටුවේ නිර්දේශ මත ක්‍රියාත්මක කර ඇත. |

### 1.6.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු වේ. එසේම, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විගණන විමසුම පරිදි ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය<br>නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1969 අංක 16 දරන හා 1981 අංක 27 දරන (සංශෝධන) ඉඩම් සංවර්ධන පනත | | | |
| (i) 464 පරිච්ඡේදයෙහි XII වන වගන්තියෙහි 172 වැනි උප වගන්තිය හා 03 වන උපලේඛණය | වවුනියාව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් රජය මගින් පරිත්‍යාග ලෙස ලබා දුන් අක්කර 14, රූඩ් 02 හා පර්චස් 05 ක ප්‍රමාණයකින් යුත් ඉඩම් අයිතිය පැවති මුල් අයිතිකරුට තම දූ දරුවන් හට පමණක් ඉඩම් අයිතිය පැවරිය හැකි වුවත්, ඊට පටහැනිව මුල් | 1969 අංක 16 දරන හා 1981 අංක 27 දරන (සංශෝධන) ඉඩම් සංවර්ධන පනතේ පරිච්ඡේද 464 හි XII වන | 1969 අංක 16 දරන හා 1981 අංක 27 දරන (සංශෝධන) ඉඩම් සංවර්ධන පනතේ පරිච්ඡේද 464 හි XII වන වගන්තියෙහි 138 වැනි උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම්ට හා ප්‍රාදේශීය |

| | | | | |
|---|---|---|---|---|
| | | අයිතිකරුගේ දුවගේ ස්වාමි පුරුෂයා හට 2010 අප්‍රේල් 27 දින ඉඩම් අයිතිය පවරා තිබීමෙන් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් මෙම පනතෙන් පනවා තිබූ බලය ඉක්මවා කටයුතු කර තිබුණි. | වගන්තියෙහි 172 වැනි උප වගන්තිය හා 03 වන උපලේඛණය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ලේකම්ට මාරුකල හැක. |
| | (ii) 464 හි V වගන්තිය | වාරිමාර්ග කටයුතු සඳහා ලබාදුන් ඉඩමක් වෙනත් ව්‍යාපාරික කටයුත්තක් හෝ වෙනත් අරමුණු සඳහා භාවිතා කළ නොහැකි වුවද, ඕමන්ත, වවුනියා යන ප්‍රදේශයෙහි රූඩ් 02 යි පර්චස් 2.59 ක ප්‍රමාණයක ඉඩම අවුරුදු 30 ක කල්බදු පදනම මත ඉන්දියන් තෙල් සමාගමට ලබාදී තිබුණි. | 1969 අංක 16 දරන හා 1981 අංක 27 දරන (සංශෝධන) ඉඩම් සංවර්ධන පනතේ පරිච්ඡේද 464 හි XII වන වගන්තියෙහි 172 වැනි උප වගන්තිය හා 03 වන උපලේඛණය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් කිසිදු ලියවිල්ලක් ලිපිගොනුවේ නොමැත. එය වැරදි ක්‍රියාවක්බව පිළිගනිමි. මේ සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්ගේ උපදෙස් මත ඉදිරි පියවර ගනු ලැබේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන VIII පරිච්ඡේදයේ 10.1 | එදිනෙදා සිදුකරන දෙපාර්තුමේන්තුමය වැඩ වෙනුවෙන් සති අන්ත සහ රජයේ නිවාඩු දින සඳහා රු.43,265 ක් ගෙවීම් කර තිබුණි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | හදිසියේ අවසන් කළ යුතු වැඩ කොටස් ඉටු කිරීම සඳහා නිවාඩු දින රාජකාරියේ යෙදී ඇත. ඉදිරියේදී විගණන විමසුම පරිදි කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 237(අ) | වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවස්ථා 19 කදී මිලදීගත් රු.4,824,150 ක් වටිනාකමැති භාණ්ඩ නිසි පරිදි ගබඩාවට ලැබුණු බවට ගබඩා භාරකරුගෙන් ලබාගත් සහතිකයක් වවුචරයට අමුණා නොතිබුණි. | භාණ්ඩ නිසි පරිදි ගබඩාවට ලැබුණු බවට ගබඩා භාරකරුගෙන් ලබාගත් සහතිකයක් වවුචරයට ඇමිණිය යුතු වීම. | විගණන විමසුම පරිදි කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන - 2006 -------------------------- | | | |

| | | | |
|---|---|---|---|
| (i) 2.6.1 ඡේදය | වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවස්ථා 14 කදී මිලදීගෙන තිබුණු රු.4,781,640 ක් වූ පරිගණක හා යන්ත්‍ර අදාළ පිරිවිතර වලට අනුව ලැබී ඇති බවට තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් පරීක්ෂා කර බලා වාර්තාවක් ලබාදී නොතිබුණි. | මිලදීගෙන තිබුණු පරිගණක හා යන්ත්‍ර අදාළ පිරිවිතර වලට අනුව ලැබී ඇති බවට තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් පරීක්ෂා කර බලා වාර්තාවක් ලබා ගත යුතු වීම. | රු.3,438,500 ක් වූ යන්ත්‍ර සඳහා ටෙන්ඩර් කිරීමේදී එක් අයෙකු පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කර තිබුණු නිසා එම ටෙන්ඩර්කරුගෙන් මිලදී ගැනීමට කටයුතු කරන ලදී.<br><br>රු.275,650 ක් වූ පරිගණක සහ සීසී ටීවී කැමරාව ප්‍රසම්පාදන පිරිවිතර වලට අනුව භාණ්ඩ වල පිරිවිතර සටහන්ව තිබූ නිසා තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තා ලබා නොගන්නා ලදී.<br><br>රු.643,490 ක් වූ උපකරණ සඳහා වවුනියාවේ සැපයුම්කරුවන් නොමැති නිසා පුදුකුඩිඉරිප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ තාක්ෂණික ඇගයීම් වාර්තා අනුව මිලදී ගන්නා ලදී. |
| (ii) 6.3.8 ඡේදය | වවුනියා දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය යටතේ කැඳවන ලද මිල ගණන්පත් විවෘත කිරීමේ වාර්තා සටහන් කර නොතිබුණි. | වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය යටතේ කැඳවන ලද මිල ගණන්පත් විවෘත කිරීමේ වාර්තා තිබිය යුතු වීම. | විගණන විමසුම පරිදි ඉදිරියේදී කටයුතු කරමි. |
| (iii) 3.5 හෝ 3.6 ඡේදයට යොමුව, 2017 මාර්තු 15 දිනැති අතිරේක 33 | එක් දිනකදී එක් කටයුත්තක් සඳහා රු.15,000 ක් නොඉක්මවන පරිදි සෘජු මිලදී ගැනීම් සිදුකළ හැකි වුවත් ඊට පටහැනිව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවස්ථා 5 කදී රු.225,420 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි. | ප්‍රසම්පාදන විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | මෙම මිලදී ගැනීම් බොහොමයක් වෙනත් අමාත්‍යාංශ වැය ශීර්ෂයන් යටතේ මිලදීගෙන ඇත. මෙම මිලදී ගැනීම් සඳහා අභ්‍යන්තර විගණන කමිටුවලින් විමසා සිටියද පිළිතුරු මේ දක්වා ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | කළමනාකරණ විගණන දෙපාර්තුමේන්තුවේ 2012 ජනවාරි මස 13 දිනැති අංක DMA/2012 /07 දරණ චක්‍රලේඛය | අභ්‍යන්තර විගණන කටයුතු කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා පරිගණක ගත තොරතුරු පද්ධතියක් තුල (CIS) අභ්‍යන්තර විගණන කටයුතු ඉටු කිරීම සිදු කලයුතු බවට දක්වමින් මාර්ගෝපදේශ හා ප්‍රශ්ණාවලියක් හඳුන්වා දී තිබුණද අභ්‍යන්තර විගණන නිළධාරියා අදාළ චක්‍රලේඛය පරිදි කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු වීම. | පිළිතුරු දී නැත. |
| (ඊ) | 2018/09/04 දිනැති අංක 22/2018 දරන හා 2018/07/11 දිනැති අංක 03/2018 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛ සහ 2018/07/23 දිනැති අංක 19/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වර්ෂ 05 කට වරක් රජයේ නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත්විය යුතු වුවත් වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් සේවය කරනු ලබන නිලධාරීන් 136 දෙනෙකු සිටින බව නිරීක්ෂණය විය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වෙනත් අමාත්‍යාංශවල සහ දෙපාර්තමේන්තුවල වසර 05 ට වැඩි සේවය කළ නිලධාරීන් සම්බන්ධයෙන් එම අමාත්‍යාංශවල සහ දෙපාර්තමේන්තුවලට දැනුවත් කර ඇති අතර අනෙකුත් නිලධාරීන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්ට තොරතුරු යවා ඇත. |
| (උ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ හි 3.1 ඡේදය | වෙංගාලසෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහන 06 ක ඉන්ධන පරික්ෂාවන් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉහත වාහන 06 න් පික්අප් 02 සඳහා ඉන්ධන පරික්ෂාවන් සිදුකර ඇත. අනෙකුත් වාහන වන ට්‍රැක්ටර් රථ 04 අවශ්‍යතාවය පරිදි වරින් වර පමණක් භාවිතා කරන බැවින් එම අවස්ථාවල ඉන්ධන පරික්ෂාව සිදුකිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/04 දරන ඉඩම් සංවර්ධන චක්‍රලේඛය | රජය මඟින් පරිත්‍යාග ලෙස ඉඩම් ලබාදුන් අයවලුන්ට නැවත රජයේ ඉඩම් ලබා නොදිය යුතු බවට මෙම චක්‍රලේඛය මඟින් උපදෙස් දී තිබුණද, ඊට පටහැනිව හිටපු දිස්ත්‍රික් ලේකම්වරියගේ මවට ඕමන්ත, වවුනියාවෙහි රූඩ් 02 ක ප්‍රමාණයකින් යුත් ඉඩමක් වවුනියා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ලබා දී තිබුණි. | 1969 අංක 16 දරන හා 1981 අංක 27 දරන (සංශෝධන) ඉඩම් සංවර්ධන පනතේ පරිච්ඡේද 464 හි XII වන වගන්තියෙහි 172 වැනි උප වගන්තිය හා 03 වන උපලේඛණය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 1969 අංක 16 දරන හා 1981 අංක 27 දරන (සංශෝධන) ඉඩම් සංවර්ධන පනතේ පරිච්ඡේද 464 හි XII වන වගන්තියෙහි 138 වැනි උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම්ට හා ප්‍රාදේශීය ලේකම්ට මාරුකල හැකි බව දක්වා ඇත. ඒ අනුව 03 වන උපලේඛණය නොසලකා කටයුතු කර ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 වියදම් කළමනාකරණය**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී සම්පූර්ණව හා නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කිරීම, ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. එසේ වුවද රු.100,000 ක් ඇස්තමේන්තු කර තිබුණු එක් පුනරාවර්තන වැය විෂයක් වෙනුවෙන් වෙනත් වැය විෂයන්ගෙන් රු.900,000 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණු අතර, එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 900 ක ප්‍රතිශතයක් විය. | අවශ්‍යතා නිසි ලෙස හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිදහස් දුම්රිය බලපත්‍ර සඳහා ගෙවීම් කළ බැවින් 2018 වර්ෂයේ ආරම්භයේ රු.100,000 ක ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා FR 66 අනුව රු.900,000 ක් ලබාගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැය විෂය සඳහා සලසා තිබුණු රු.1,000,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම මුදල් රෙගුලාසි 66 අනුව වෙනත් වැය විෂයකට මාරු කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව සම්පූර්ණව හා නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | ජෙනරේටයක් මිලදී ගත යුතු අවශ්‍යතාවයක් තිබුණු නමුත් මෙම මුදල ප්‍රමාණවත් නොවූ බැවින් නව සම්මන්ත්‍රණ ශාලාවට අවශ්‍ය වායුසමීකරණ යන්ත්‍ර ආදිය මිලදී ගැනීමේ අවශ්‍යතාවයට මාරු කරගන්නා ලදී. |
| (ඇ) | මූලධන වැය විෂයක් සඳහා සලසා තිබුණු රු.1,000,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.343,400 ක් ඉතිරි කර තිබුණු අතර ඉතිරි කිරීමේ ප්‍රතිශතය සියයට 34 ක් විය. | අවශ්‍යතා නිසිලෙස හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | වර්ෂය ආරම්භයේ වියදම් වැඩි වුවත් අවසන් මාස වල බලාපොරොත්තු වූ වියදම් සිදුනොවීම නිසා ඉතිරිවීම් විය. |

## 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදනඋපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජාතික සමගිය හා සංහිදියා කාර්යාංශයේ ප්‍රතිපාදනවලින් රු.4,130,000 ක් වැය කර වවුනියා උතුර ප්‍රාදේශිය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ 2017 දෙසැම්බර් 27 දින ඉදි කර අවසන් කර තිබුණු පළතුරු සැකසීමේ මධ්‍යස්ථානය 2018 පෙබරවාරි 07 දින ප්‍රදේශයේ පළතුරු වවන්නන්ගේ සමුපකාර සමිතියක් වෙත පවරා තිබුණි. එසේ වුවද, 2018 දෙසැම්බර් 04 දින වන විටද මෙකී ගොඩනැගිල්ල පළතුරු සැකසීමේ කර්මාන්තය සඳහා යොදාගෙන නොතිබුණු අතර, පළතුරු සැකසීමේ කර්මාන්තය සඳහා අවශ්‍ය යන්ත්‍ර සහ උපකරණ සහ පුහුණුවීම් සහ තාක්ෂණික උපදෙස් ලබා ගන්නා ආකාරය පිළිබඳව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ හෝ පළතුරු වවන්නන්ගේ සංගමයේ සැලසුමක් නොතිබුණි. ඒ අනුව, මෙකී ගොඩනැගිල්ල වසරක් පුරා අරමුණින් බැහැරව නිෂ්කාර්යව පැවතුණි. | ගොඩනැගිල්ල පළතුරු සැකසීමේ කර්මාන්තය සඳහා යොදා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම හෝ වෙනත් ඵලදායී කාර්යයක් සඳහා මෙම ගොඩනැගිල්ල යොදා ගත යුතු වීම. | මෙම කර්මාන්තය සඳහා යන්ත්‍ර තවමත් සම්පූර්ණයෙන් ලැබී නැති නිසා පළතුරු සැකසීමේ කර්මාන්තය වැඩ ආරම්භ කිරීමට නොහැකි වී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන වෙංගාල සෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ රු.1,077,044 ක වියදමින් අළුතින් කපා බොරළු යොදා සකස් කරන ලද සින්නවිප්පිකුලම් රසීඩ් වත්ත පාර තනි පුද්ගලයකුගේ අක්කර 10 ක් පමණ වූ පෞද්ගලික ඉඩමකට පිවිසීම සඳහා ඉදිකර තිබුණි. තවද, සභා බල ප්‍රදේශයෙහි අලුතින් මාර්ග ඉදිකිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන අදාළ ප්‍රාදේශීය සභාව වෙතින් ලබාගෙන නොතිබුණි. එසේම, ඇස්තමේන්තු විෂයය අංක 08 ප්‍රකාරව සකස් කරන ලද නාම පුවරුවක් මාර්ගයේ සවිකර නොතිබුණු අතර, ව්‍යාපෘති ඉදිකිරීම තුළින් පහසුකම් සැලසෙන ප්‍රතිලාභීන් ප්‍රමාණය පිළිබඳ සැලකිල්ලට නොගෙන එක් ප්‍රතිලාභියකු වෙනුවෙන් පමණක් මෙම මාර්ගය ඉදිකර තිබූ බව නිරීක්ෂණය විය. | මාර්ග ඉදිකිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන අදාළ ප්‍රාදේශීය සභාව වෙතින් ලබාගත යුතු අතර ප්‍රතිලාභීන් ප්‍රමාණය පිළිබඳ සැලකිල්ලට ගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වීම. | මෙම ප්‍රදේශයේ යුද්ධයෙන් පීඩාවට පත් ජනතාව නැවත පදිංචි කිරීම සඳහා අනාගතයේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වන බැවින් මෙම මාර්ගය ඉදිකර ඇත. දැනට මාර්ගය දෙපස නිවාස 07 ක් ඇති අතර ගවයන්ට සහ එළුවන්ට ආහාර කැවීමට රැගෙන යාම සඳහා මෙම මාර්ගය භාවිතා කරයි. |
| (ඇ) | කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයේ රු.1,925,159 ක ප්‍රතිපාදන උපයෝගී කරගෙන වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු 2018 වර්ෂයේ ඇඟලුම් ආශ්‍රිත කුඩා කර්මාන්ත ශාලා පිහිටුවීමේ වැඩසටහන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| | (i) පුහුණු ප්‍රතිලාභීන් සඳහා රැකියා සැපයීමේ අරමුණින් මැහුම් පාඨමාලා පවත්වා තිබුණු අතර, 2019 මැයි 20 දින වන විටත් උක්ත කර්මාන්තය ආරම්භ කිරීමට අපොහොසත් වී තිබූ බැවින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ලඟා කර ගැනීමට නොහැකි වී තිබුණි. | කර්මාන්තය ආරම්භ කර අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ප්‍රතිලාභීන් මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට උනන්දු නොවීම නිසා අපේක්ෂිත ප්‍රතිලාභ කුඩා කුඩා ඇඟලුම් කර්මාන්ත ශාලා සමුපකාර සමිති බවට පත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරු සහ සමුපකාර නිලධාරීන් සමඟ සාකච්ඡා කෙරේ. |
| | (ii) උක්ත අමාත්‍යාංශය විසින් මිලදීගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දී තිබුණු අයිතම 280 ක් වූ උපකරණ හා ගෘහ භාණ්ඩ වර්ෂයක් පුරා ප්‍රයෝජනයට නොගෙන මෙකී භාණ්ඩ පුහුණු | උපකරණ නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීමට හා ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතු | පුහුණු පැවති මාස 06 සඳහා මුරකරුවන්ට ගෙවීම් කළ නමුත් ඉන්පසු ගෙවීම් කටයුතු සඳහා ප්‍රතිපාදන නොමැති බැවින් මුරකරුවන් |

| | | |
|---|---|---|
| මධ්‍යස්ථාන තුළම අනාරක්ෂිතව ගබඩා කර තිබුණි. | වීම. | යොදා නොමැත. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ලබාගෙන තිබූ අතුරු අග්‍රිම, මුදලින් පියවීමේදී එය සියයට 40 ඉක්මවා තිබූ අවස්ථා දෙකක් නිරීක්ෂණය විය. | අවශ්‍යතා පුරෝකථනය කිරීමෙන් පසුව අතුරු අග්‍රිම ලබාගත යුතු වීම. | ඇස්තමේන්තුවට අනුව අත්තිකාරම් නිකුත් කළද අනපේක්ෂිත ආකාරයට අදාළ වැය විෂය අඩුවීම, ඇතැම් වියදම් චෙක්පත් මඟින් ගෙවීමට සිදුවීම, වැඩසටහනේ ඇතැම් විෂයන් සිදු නොකිරීම සහ සහභාගීවන්නන් අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩුවීම වැනි හේතු නිසා අත්තිකාරම් මුදල් ආපසු ගෙවීමට සිදුවන අවස්ථා ඇත. |
| (ආ) මුදල් රෙගුලාසි 371(2) (අ) ප්‍රකාරව කිසියම් විශේෂිත කාර්යයන් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා අතුරු අග්‍රිම ලබා දිය හැක. ලබාගත් අතුරු අග්‍රිමය පියවීමට පෙර නැවත අතුරු අග්‍රිම ලබාදිය නොහැක. එසේ වුවද, අවස්ථා දෙකකදී එක් අග්‍රිමයක් පියවීමට පෙර නැවත අතුරු අග්‍රිම ලබාදී තිබුණි. | පෙර අතුරු අග්‍රිම පිය වූ පසු නැවත අතුරු අග්‍රිමයක් ලබා දීමට කටයුතු කළ යුතු වීම. | මාණ්ඩලික නිලධාරීන් ලබා ගන්නා ලද අත්තිකාරම් මුදල නිරවුල් නොකළ විට ඔහුට නැවත අත්තිකාරම් ලබානොදෙන නමුත් අදාළ වැඩසටහන සඳහා අත්තිකාරම් මුදලක් අවශ්‍යයැයි සැලකූ ඇතැම් අවස්ථාවලදී පමණක් භාරව කටයුතු කරන නිලධාරීන්ට අත්තිකාරම් මුදල් නිකුත් කරන නමුත් රු.100,000 ක උපරිමයක් දක්වා පමණක් ලබාදී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2015 ජුලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 3/2015 හි (අ) ඡේදය ප්‍රකාරව මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් අතුරු අග්‍රිම නිකුත් කළ යුතු වුවත්, මාණ්ඩලික නොවන නිලධාරීන්ටද එකතුව රු.141,500 ක් වූ අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. | මාණ්ඩලික තත්ත්වයේ නිළධාරින්ට පමණක් අතුරු අග්‍රිම නිකුත් කළ යුතු වීම. | 2019 වර්ෂයේ මාණ්ඩලික නිලධාරීන්ට පමණක් අත්තිකාරම් මුදල් නිකුත් කෙරේ. |
| (ඈ) | මුදල් රෙගුලාසි 371 (5) වගන්තිය ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත එම අතුරු අග්‍රිමයන් නැවත පියවිය යුතු වුවත් දින 13 සිට මාස 03 ක කාල ප්‍රමාදව අතුරු අග්‍රිම පිය වූ අවස්ථා 09 ක් නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත එම අතුරු අග්‍රිමයන් නැවත පියවිය යුතු වීම. | අනෙකුත් ගෙවීම් සමඟ ලේඛණගතකොට ගෙවීම් සඳහා ඉදිරිපත් කරන බැවින් ප්‍රමාදවීම් සිදු වී ඇති අතර ඇතැම් නොවැලැක්විය හැකි හේතුන් නිසා ගෙවීම් ප්‍රමාද වූ අවස්ථා ඇත. 2019 වර්ෂයේ නිවැරදිව පියවීම් කටයුතු සිදුකිරීමට පියවර ගනිමි. |

**2.4 තැන්පතු**

----------

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පොදු තැන්පත් ගිණුමෙහි තැන්පත් කොට වර්ෂ 2 ඉකුත් වූ රු.812,269 ක් වටිනාකමැති තැන්පතු නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම ශේෂයන් 2019 ජනවාරි මස නිරවුල් කිරීමට කටයුතු කර ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 සැලසුම් කිරීම**

---------------

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර, ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි ආයතනයේ සංවිධාන | චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වීම. | අමාත්‍යාංශය විසින් එවන ලද අකෘති පත්‍රය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත. |

සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යය මණ්ඩලය, දැනට සිටින කාර්යය මණ්ඩලය, වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා සැලසුම්, අපේක්ෂිත නිමවුම් මට්ටම සහ වාර්ෂික අක්මුදල් අවශ්‍යතා යනාදී තොරතුරු ඇතුලත්ව නොතිබුණි.

**3.2 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති**

-------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | -------------------------------- |
| (අ) | 2018 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකරන ලද රු.19,125,502 ක් වූ ඉදිකිරීම් 03 ක් සඳහා අනුමත කල ඉංජිනේරු ඇස්තමේන්තු පදනම් කරගෙන මිල කැඳවීම් කර තිබුණද, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ මත සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමෙන් පසු දිස්ත්‍රික් ඉංජිනේරුවරයා විසින් ඇස්තමේන්තු නැවත සංශෝධනය කර අනුමත කර නොතිබුණි. නව ඇස්තමේන්තුවලට අනුව ඉදිකිරීම් හා ගෙවීම් කටයුතුද සිදුකර තිබුණි. මෙම සංශෝධිත ඇස්තමේන්තු සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ හා ප්‍රසම්පාදන කමිටු අනුමැතියද ලැබී නොතිබුණි. තවද, සේවාදායකයාගේ ඉල්ලීම මත හෝ තාක්ෂණික හේතු මත මුල් ඉංජිනේරු ඇස්තමේන්තු වෙනස් කල බවට වන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සංශෝධිත ඇස්තමේන්තුවලට අනුමැතිය සහ තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ලබා ගත යුතු විම. | මුල් ඇස්තමේන්තු වටිනාකමින් සියයට 10 ක සීමාව ඇතුළත ඇස්තමේන්තු සංශෝධනය කර ඇති නිසා සංශෝධිත ඇස්තමේන්තුවලට අනුමැතිය සහ තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ලබා ගත යුතු නොවේ. |
| (ආ) | ඉහත ඉදිකිරීම් අතරින් වෙංගාලසෙට්ටිකුලම් ගොඩනැගිල්ලේ කොටස් බෙදා වෙන්කිරීම සඳහා ඉංජිනේරු නිර්දේශ ප්‍රකාරව මිලි මීටර් 5 ක ඝණකමින් යුතු වර්ණ ගැන්වූ වීදුරු (Tinted glass) වෙනුවට මිලිමීටර් 5 ඝණකමින් යුතු පැහැදිලි වීදුරු (Clear glass) යොදා තිබුණි. | ගොඩනැගිල්ලේ කොටස් බෙදා වෙන්කිරීම සඳහා ඉංජිනේරු නිර්දේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | රඳවා ගැනීම් මුදලින් අඩු කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉහත (අ) හි සඳහන් ගොඩනැගිල්ල සඳහා දිස්ත්‍රික් ඉංජිනේරුවරයා විසින් නිවැරදි මිනුම් ගෙන ඇස්තමේන්තු සකස් නොකිරීමෙන් ගොඩනැගිල්ලේ වහල සකස් කිරීමේදී “C” හැඩැති ගැල්වනයිස් ෆර්ලිං දිග මීටර් 175.2 අතිරේකව සපයා සවිකර තිබුණි. එම අතිරේක වැඩ සඳහා කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ රේටය වූ දිග් මීටරයක් සඳහා රු.1,000 බැගින් ගෙවීම් නොකර ඉංජිනේරු මිල විශ්ලේෂණ අංක 03 ට අනුව (ESR) දිග් මීටරයක් සඳහා රු.1,663 බැගින් ගෙවීම් කිරීම හේතුවෙන් දිග් මීටර එකකට රු.663 බැගින් දිග් මීටර 175.2 ක් සඳහා රු.116,157 ක අධි වැයක් රජයට දැරීමට සිදුවී තිබුණි. | අතිරේක වැඩ සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ රේටය පරිදි ගෙවිය යුතු වීම හා සිදු වී ඇති අලාභය සම්බන්ධයෙන් අදාල පාර්ශවයන්ට එරෙහිව කටයුතු කල යුතු වීම. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල නොකිරීම නිසා මෙලෙස සිදුවී ඇති අතර අනාගතයේ මෙලෙස සිදු නොවීමට සටහන් කර ගතිමි. |
| (ඈ) | වෙංගාලසෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සාද නිවාසය ඉදිකිරීමට අදාළව ඉංජිනේරු ඇස්තමේන්තුවේ ඇතුළත් රු.430,375 ක් වටිනාකමැති වැඩ අයිතම 04 ක් ඇස්තමේන්තුවේ වැඩ විස්තරයේ සඳහන් පිරිවිතර වලට අනුව සිදුකර නොතිබියදී ඒ වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. | ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ විස්තරයේ යටතේ ඇති පිරිවිතර වලට අනුව සිදු කළ වැඩ කොටස් සඳහා පමණක් ගෙවීම් කළ යුතු වීම. | සාද නිවාසයේ සිවිලිම මිලිමීටර් 5 ට ඇස්තමේන්තු කර තිබුණද සාමාන්‍ය වෙළඳපලේ ඇති සිවිලිම මිලිමීටර් 4.88 ක් වේ. එය සවිකර ඇති අතර විමසුමේ දක්වා ඇති පරිදි මිලිමීටර් 3 ක් සවිකර නොමැත. අනෙකුත් අඩුපාඩු රැඳවුම් මුදල් ගෙවීමට පෙර සකස් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පළමු මහල ඉදිකිරීමට අදාලව ඉංජිනේරු ඇස්තමේන්තුවේ ඇතුළත් රු.706,100 ක් වටිනා වැඩ අයිතම 02 ක් ඇස්තමේන්තුවේ වැඩ විස්තර ඇතුළත් පිරිවිතර වලට අනුව සිදුකර නොතිබුණද ඒ සඳහා ගෙවීම් කිරීමේදී රු.706,100 ක මුළු මුදලම ගෙවා තිබුණි. | ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ විස්තරයේ යටතේ ඇති පිරිවිතර වලට අනුව සිදු කළ වැඩ කොටස් සඳහා පමණක් ගෙවීම් කළ යුතු වීම. | විගණන විමසුමේ දක්වා ඇති පොඩි පොඩි අඩුපාඩු සාමාන්‍යයෙන් සිදුවන ඒවාය. ඇස්තමේන්තුවේ දෙවරක් ආරක්ෂිත තීන්ත යෙදිය යුතු බවට දක්වා ඇත්තේ වැරදීමකිනි. පැස්සුම් ස්ථානවලට පමණක් ආරක්ෂිත තීන්ත ආලේප කිරීම ප්‍රමාණවත් බැවින් එලෙස කර ඇත. යකඩ පට්ටම්වල ඝනකම Vernire Calliper යන්ත්‍රය භාවිතා කර මැනීම සිදුකර නොමැත. |
| (ඊ) | වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පළමු මහල ඉදිකිරීමට සමගාමීව සිදුකර තිබුණු බිම් ඇතිරුම් ගල් සපයා සවි කිරීමේ කටයුත්තේදී ඉංජිනේරු නිර්දේශයට අනුව ගල්වල ශක්තිය $15N/mm^2$ හා $25\ N/mm^2$ අවස්ථා දෙකකදී ඉංජිනේරු නිර්දේශ ලෙස ලබාදී තිබුණි. එහෙත් මෙම වැඩ අයිතමය සඳහා වර්ග මීටර 208 කට අදාළව රු.821,952 ක් ගෙවීම් කිරීමට පෙර බිම් ඇතුරුම් ගල්වල ඉංජිනේරු නිර්දේශ ප්‍රකාරව ශක්තිය තිබුණේද යන්න පරීක්ෂණ වාර්තා ලබාගෙන නොතිබුණි. | ගෙවීම් කිරීමට පෙර බිම් ඇතුරුම් ගල්වල ඉංජිනේරු නිර්දේශ ප්‍රකාරව ශක්තිය තිබුණේද යන්න පරීක්ෂණ වාර්තා ලබාගත යුතු වීම. | ඇස්තමේන්තුවේ සඳහන් බිම් ඇතිරුම් ගල් වලට වඩා ශක්තිමත් බැවින් වැඩි V හැඩැති බිම් ඇතිරුම් ගල් සවිකර ඇති අතර ක්‍රොන්ත්‍රාත්කරු වර්ග මීටරයකට ඉල්ලා ඇති රු.4,500 නොගෙවා අමතර වැඩ සඳහා රු.2,862 ක් ගෙවා ඇත. |
| (උ) | ඉහත ගොඩනැගිල්ලේ අත්වැට සැකසීමට භාවිතා කළ යුතු සුදු යකඩ 302 කේතය යටතේ ගුණාත්මක විය යුතු බවට ඉංජිනේරු නිර්දේශ ලබාදී තිබුණත් ඒ සඳහා රු.101,506 ක් ගෙවීම් කිරීමට පෙර රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබාගෙන අදාළ ගුණාත්මකභාවය පිළිබඳ තහවුරු කර නොගෙන ගෙවීම් සිදුකර තිබුණි. | ගෙවීම් කිරීමට පෙර රසායනාගාර පරීක්ෂණ හෝ උචිත පරීක්ෂණ වාර්තා ලබාගෙන අදාළ ගුණාත්මකභාවය පිළිබඳ තහවුරු කර ගෙන ගෙවීම් සිදුකළ යුතු වීම. | අත්වැට සැකසීමට භාවිතා කළ සුදු යකඩ ප්‍රමාණය සුළු ප්‍රමාණයක් නිසා එයට රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට විශාල මුදලක් වැය වන බැවින් එසේ සිදුකර නොමැත. වැඩි ප්‍රමාණයක් භාවිතා කරන අවස්ථාවක විමසුම පරිදි කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,476,918 ක වියදමින් නාගරිප්පායිකුලම් හි ප්‍රජාශාලාවක් ඉදිකර තිබුණු අතර, ඉංජිනේරු ඇස්තමේන්තුවේ ඇතුළත් රු.112,887 ක් වටිනා වැඩ අයිතම 2 ක් සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ විස්තරය යටතේ ඇති පිරිවිතර වලට අනුව සිදුකර නොතිබිය දී මුළු මුදලම ගෙවා තිබුණි. | ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ විස්තරයේ යටතේ ඇති පිරිවිතර වලට අනුව සිදු කළ වැඩ කොටස් සඳහා පමණක් ගෙවීම් කළ යුතු වීම. | පිළිතුරු දී නැත. |
| (එ) | වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු. මිලියන 2.5 ක වියදමින් ඉදිකර තිබුණු සිරිරාම්පුරම් ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සතුටුදායක ලෙස නිමකර ඇති බවට 2018 නොවැම්බර් 02 දිනැති වැඩ අවසන් කිරිමේ වාර්තා සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලැබී තිබුණි. එහෙත් ඉංජිනේරු ඇස්තමේන්තුවේ ඇතුළත් රු.14,474 ක් වටිනා වැඩ අයිතම 02 ක් ඉටු නොකිරීම, සපයා සවිකර තිබුණු 4’x 4’ ප්‍රමාණයේ ජනේල නිසි ලෙස වැසිය නොහැකි වීම, වහළය සඳහා භාවිතා කර තිබුණු ලී වල ඉංජිනේරු නිර්දේශ ප්‍රකාරව දැව ආරක්ෂක ආලේප කර නොතිබූ අවස්ථා පැවතීම, වැඩ අවසන් වීමෙන් පසු වැඩ බිම පිරිසිදු නොකර භාර දී තිබීම යන අඩුපාඩු නිරීක්ෂණය විය. ඒ අනුව, මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් වැඩ සම්පූර්ණ කිරීමේ වාර්තා නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. | ඉංජිනේරු ඇස්තමේන්තු ප්‍රකාරව වැඩබිම පරික්ෂා කර නිවැරදි වැඩ අවසන් කිරීමේ වාර්තා ලබාදිය යුතු වීම. | වැඩබිම පිරිසිදු කර තිබුණත් අසල්වැසි නිවැසියන්ගේ ගවයන් පැමිණීම නිසා අපිරිසිදු වී පැවතුණි. දක්වා තිබූ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ඒ) | වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,467,836 ක වියදමින් කානේශපුරම් පොදු සුසානභූමි ශාලාව ඉදිකර තිබුණ අතර, ඉංජිනේරු ඇස්තමේන්තුවේ රු.101,381 ක් වටිනා වැඩ අයිතම 02 ක් ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ විස්තරයේ යටතේ ඇති පිරිවිතර වලට අනුව සිදු නොකර තිබියදී, ඉදිකිරීම සතුටුදායක ලෙස නිමකර ඇති බවට සහතික කර රු.101,381 ක මුළු මුදලම ගෙවා තිබුණි. | ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ විස්තරයේ යටතේ ඇති පිරිවිතරවලට අනුව සිදු කළ වැඩ කොටස් සඳහා පමණක් ගෙවීම් කළ යුතු වීම. | ඇස්තමේන්තුවේ ඉටු නොකළ වැඩ කොටස් සඳහා රඳවා ගැනීම් මුදලින් අඩු කර ගැනීමට කටයුතු කරන අතර අනාගතයේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට වග බලා ගනිමි. |

**3.3 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 වගන්තිය ප්‍රකාරව සහ 3.9.2 හි සඳහන් කමිටුවක නිර්දේශ මත 3.9.4 හි වටිනාකම නොඉක්මවන පරිදි ඉදිකිරීම් වැඩ සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් ලියාපදිංචි කර ඇති අනුමත සමිති වලින් මිල ගණන් කැඳවිය හැකි විය. එහෙත් එපරිදි කටයුතු නොකර රු.2,000,000 ට අඩු වටිනාකමක් ඇති ඉදිකිරීම් සඳහා තරඟකාරී ලංසු කැඳවීම කර එය අසාර්ථක වීමෙන් පසු නැවතත් ප්‍රජාපාදක සංවිධාන සඳහා ව්‍යාපෘති ලබාදීම හේතුවෙන් පළමු ලංසු කැඳවීම සඳහා දරන ලද රු.238,567 ක මුදල නිෂ්කාර්ය වියදමක්ව තිබුණි. | අවම පිරිවැයක් යටතේ ප්‍රසම්පාදන කටයුතු කළ යුතු අතර ප්‍රසම්පාදනයට පෙර ප්‍රසම්පාදන කමිටුව විසින් නිවැරදි ප්‍රසම්පාදන ක්‍රමවේදය තීරණය කළ යුතු වීම. | තරඟකාරී පදනමක් මත කොන්ත්‍රාත් ලබා දීම සඳහා පළමුව ජාතික මට්ටමින් මිල කැඳවීම් කළද කොන්ත්‍රාත් කරුවන් අවශ්‍යතා සපුරා නොතිබීම හේතුවෙන් එකී මිල ගණන් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට සිදුවිය. පසුව ප්‍රජාපාදක සංවිධාන සඳහා ව්‍යාපෘති ලබාදෙන ලදී. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආපන ශාලාවෙන් ලබන රු.10,000 ක් වූ මාසික කුලියෙන් රු.5,000 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවක සුබසාධක සංගමයට බැර කර තිබුණි. | රජයට අලාභයක් සිදුනොවන පරිදි ආපන ශාලාවේ කුලිය තීරණය කළ යුතු වීම. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආපන ශාලාවේ ඇති සියලුම උපකරණ සුබසාධක සංගමයට අයත් බැවින් කුලියෙන් කොටසක් එකී සංගමයට ගෙවනු ලබයි. |
| (ඇ) | වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පෙර සූදානමක් සහිතව කළ හැකිව තිබූ කාර්යයන් සඳහා මිල කැඳවීමකින් තොරව අවස්ථා 4 කදී රු.119,650 ක් ගෙවා භාණ්ඩ හා සේවා ඍජු මිලදී ගැනීම් යටතේ සිදුකර තිබුණි. | පූර්ව මිල කැඳවීමක් කර ලබා ගත හැකි භාණ්ඩ හා සේවා එපරිදි ලබා ගත යුතු වීම. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ අතිරේක අංක 33 ට අනුව රු.15,000 ට අඩු වටිනාකම් මෙලෙස ලබාගෙන ඇත. ඉදිරියේදී පෙර සූදානමක් සහිතව මිලදී ගැනීමට කටයුතු කරමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙතින් 2017 ජූලි 25 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු ට්‍රැක්ටරයක් සහ බවුසරයක් හා වෙංගාලසෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු යතුරු පැදියක් 2015 අගෝස්තු 31 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | අදාළ යන්ත්‍ර පාවිච්චියට ගැනීම හෝ අපහරණය හෝ පාවිච්චියට ගතහැකි වෙනත් ආයතනයකට පවරා දීම කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නැත. |

## 3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වවුනියා දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතරෙහි සේවය කරනු ලබන ඇප තැබිය යුතු නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 880(1) ප්‍රකාරව ඇප තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි 880(1) ප්‍රකාරව ඇප තැබිය යුතු වීම. | ඇප මුදල් ලබා ගැනීමට පියවර ගනිමි. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වෙංගාලසෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.124,980 ක් වියදමින් සවිකර තිබුණු ආරක්ෂිත කැමරා පද්ධතිය පවත්වාගෙන යාමේ වගකීම නිශ්චිතව කිසියම් නිලධාරියෙකුට ලිඛිතව පවරා නොතිබුණු අතර, දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියක් සකසා ඒ අනුව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි. තවද, පරිපාලන මුර පදය (Admin Password) කාර්යාලීය නිලධාරින් අතර හුවමාරු කරමින් භාවිතා කිරීමේ හේතුවෙන් දත්ත විනාශ කිරීමේ හැකියාවක් පවතින බවද නිරීක්ෂණය විය. | ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් පවත්වාගත යුතු වීම. | ආරක්ෂක කැමරා පද්ධතිය සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් පවත්වා ගැනීමට කටයුතු කරමින් පවතී. පරිපාලන මුර පදය (Admin Password) ප්‍රාදේශීය ලේකම් භාරයේ පවතී. |
| (ආ) | හිටපු දිස්ත්‍රික් ලේකම්වරියගේ ස්වාමි පුරුෂයා විසින් A-9 පාර, ඕමන්ත, වවුනියාව යන ස්ථානයේ පිහිටි රජයේ ඉඩමක අනවසර ඉදිකිරීමක් සිදුකර තිබුණද, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග වවුනියාව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ගෙන නොතිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතිය දෙනු ලබන්නේ ප්‍රාදේශීය සභාව හෝ නගර සභාව විසින් වන අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතිය දෙනු නොලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නොච්චිමොට්ට ග්‍රාම නිළධාරී වසමට අයත් තම්බනකුලම්හි පිහිටි අක්කර 9.4 ක ප්‍රමාණයක වූ රජය සතු ඉඩම් පුද්ගලයින් තිදෙනෙකු විසින් අනවසරයෙන් අත්පත් කරගෙන තිබුණද, මේ සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට වවුනියාව ප්‍රාදේශීය ලේකම්වරයා කටයුතු කර නොතිබුණි. | අනවසරයෙන් අත්පත් කරගෙන තිබුණු ඉඩම් සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු වීම. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් සහකාර කොමසාරිස්ගේ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන ආඥා පනතේ 83 වගන්තිය ප්‍රකාරව මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට විධිවිධාන නොමැති බැවින් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාට දන්වා යවා ඇත. |

**4. යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා 20 ක පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යවා නොතිබුණි. | අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු වීම. | Online ක්‍රමය යටතේ විගණන වාර්තා යවා ඇත. |